අඹගමුව ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 11 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අඹගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (I) | 2014 වර්ෂයේදී ගමනැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන වෙන්කර තිබූ නෝර්වුඩ් කෝවිල් ප්‍රජාශාලාව ඉදිකිරීම ආරම්භකර නොතිබියදී ප්‍රතිපාදන වෙන් කිරීම නිසා කර්මාන්ත ණය ගැතියන් සහ කර්මාන්ත ණය හිමියන් රු.5,000,000 බැගින් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්විණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ අනුව නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (II) | 2011 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 19 කදී ආදායම් වෙනුවෙන් තැන්පත් කර ඇති රු.858,250 ක් ආපසු ගෙවිය යුතු තැන්පතු යටතේ දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී නිරවුල් කරමි. |

| | | | |
|---|---|---|---|
| (III) | 2009 වර්ෂයේ සිට 2014 දක්වා සභාව වෙත ප්‍රාග්ධන ආධාර ලෙස විවිධ ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදන වලින් අදාළ කාර්යයන් සම්පූර්ණයෙන් ඉටුනොකර, ප්‍රතිපාදන ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියන් වටිනාකම රු.14,638,340 ක්ද කර්මාන්ත ණයහිමි වටිනාකම රු.28,779,077 ක්ද වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. එම මුදල් අයවිය යුතු හෝ ගෙවිය යුතු බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කරමි. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

---------------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

-----------------------------------------------

හිමිකම් ඔප්පු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.316,500 ක් වූ ඉඩම් කැබලි 07ක හිමිකම තහවුරු කරගත නොහැකි විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිමිකම් ඔප්පු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු 316,500ක්වූ ඉඩම් කැබලි 07 ක හිමිකම තහවුරු කරගත නොහැකි විය. | හිමිකම් ඔප්පු ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම් තක්සේරුකර ඇතත් වාර්තා මෙතෙක් ලැබී නැති අතර ලේඛනයේ සඳහන් ඉඩම් පවරා ගැනීමේ සහ හිමිකම් ඔප්පු සැකසීමේ කටයුතු සිදුකරමින් පවතී. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

(I) ලැබිය යුතු ගිණුම්

---------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වසර 01 ක කාලයක් ඉක්මවූ කර්මාන්ත ණයගැති ශේෂය රු.41,808,190 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකරගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ශේෂ බොහෝමයක් පෙර වර්ෂවල ප්‍රතිපාදනයන් ගිණුම්ගත කිරීමෙන් ඇති වී ඇති අතර සාවද්‍ය ශේෂ ඉවත්කර නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

-------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 08 ක එකතුව රු.88,285,522 ක් වූ අතර, ඉන් රු.68,681,832 ක් වසරක කාලයක් ඉක්මවා ගෙවා නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | වර්ෂයකට වඩා අඩු ශේෂ ගෙවා නිමකර ඇති අතර ඉතිරි ශේෂ පිළිබඳව සොයාබලා කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | වලංගු කාලය ඉක්මවා තිබූ ව්‍යාපාර 03 ක බලපත්‍ර නැවත අළුත්කර නොතිබුණි. | ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් කර බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන හඳුනාගෙන අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවේ. | බලපත්‍ර අළුත්කර ගන්නා ලෙසට දන්වා ඇත. |
| (ආ) | මුදල් රෙගුලාසි 189 | 1988 සිට 2007 දක්වා කාල පරිච්ඡේදය තුළ අවස්ථා 21 කදී අගරු වී ඇති රු.118,659 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි | මෙම චෙක්පත් වල සඳහන් මුදල් මුදලින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගන්නේමි. |
| (ඇ) | මු.රෙ.237 | වාහන අළුත්වැඩියාවක් සඳහා රු.292,540 ක් තාක්ෂණ නිලධාරියෙකුගේ සහතිකයක් නොමැතිව ගෙවා තිබුණි. | අදාළ නිර්දේශ ලබා ගැනීමෙන් පසු ගෙවීම් කළයුතු වේ. | වර්තමානයේදී සුදුසු තාක්ෂණ නිලධාරියෙකුගේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | මු.රෙ.571(2) | අවස්ථා 22 කදී තැන්පත්කර වසර 02 ඉක්ම වූ රු.1,014,290 ක් වටිනා තැන්පතු නීයාදනය කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2019 දී නිවැරදි කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සෑම වර්ෂයකම ඉඩම් ගොඩනැගිලි පිළිබඳව සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | මේ වන විට සමීක්ෂණයක් සිදුකරමින් පවති . |
| (ඊ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව වසර 05 කට වරක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | තක්සේරුව සිදුකරන ලෙසට තක්සේරු දෙපාරත්මේන්තුවන් ඉල්ලා ඇත. |

1.6 බදු අවශතාවයන්ට අනුකූල නොවීම.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු බදු පනත අනුව සමාලෝචිත වර්ෂයට පෙර සහ සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙලින් අයකල රු.2,350,361ක සහ රු.958,253 ක මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | රඳවාගත් බදු මුදල් ගෙවීමට කටයුතු කළ යුතුවේ. | වාරික වශයෙන් බදු මුදල් ගෙවීමට කටයුතු කරමි. |
| (ආ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව පෙර වර්ෂ තුළදී එකතුකළ රු.738,143 ක ජාතිය ගොඩනැගීමේ බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | රඳවාගත් බදු මුදල් ගෙවීමට කටයුතු කළ යුතුවේ. | වාරික වශයෙන් බදු මුදල් ගෙවීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.2,026,854 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,899,898 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

2018 මාර්තු 20 දින ස්ථාපිත කර තිබූ සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස නවයක කාල පරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2018

| ආදායම් ප්‍රභවය | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,070,677 | 1,573,804 | 1,761,446 |
| කුලී | 2,387,650 | 2,504,792 | 2,339,603 |
| බලපත්‍ර ගාස්තු | 1,242,900 | 1,242,900 | 182,420 |
| වෙනත් ආදායම් | 7,228,663 | 7,539,978 | 15,595,406 |
| | 12,929,890 | 12,861,474 | 19,878,875 |

2.2.2 කුලී

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු කඩ කාමර බදුගෙන තිබුණු බදුකරුවන් 07 දෙනෙකු වසර 02 සිට වසර 10 දක්වා කාල පරාසයක සිට බදු කුලී ගෙවීම පැහැර හැර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට එම හිඟය රු.1,009,093 ක් විය. | ප්‍රාදේශිය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර හිඟ මුදල් අයකර ගතයුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.1,843,676 ක උසාවි දඩ හා රු.13,751,730 ක මුද්දර ගාස්තු අයකර නොතිබුණි. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අයඳුම්පත් ඉදිරිපත් කර ඇති බව |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) 2018 වර්ෂයේ අප්‍රේල් - දෙසැම්බර් කාලය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 නොවැම්බර් 02 දිනැති 2043/57 අංක දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් එතෙක් පැවති අඹගමුව ප්‍රාදේශීය සභාව විසුරුවා ඒ වෙනුවට නව ප්‍රාදේශීය සභා 03 ක් පිහිටුවා තිබුණි.ඒ අනුව පිහිටවූ අඹගමුව ප්‍රාදේශීය සභාව, 2018 වර්ෂයේ ඉතිරි කාලය සඳහා නව අයවැය ලේඛනයක් පිළියෙල කර සම්මත කර ගැනීමකින් තොරව වර්ෂයේ මෙහෙයුම් කටයුතු සිදුකර තිබුණි. | සංශෝධිත අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු වේ. | නොදැනුවත් භාවය නිසා සිදුවූ අතපසුවීමක් විය. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුලදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සපුරා ගැනීමට සැලසුම් සකස් කළ යුතුවේ. | මේ වන විට තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව දැනුවත් වී ඇති අතර ඒ පිළිබඳව විෂයභාර නිලධාරියෙකු පත්කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාවේ වාහන සඳහා ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් 1996 මාර්තු 03 දින මස්කෙළිය විවිධ සේවා සමිතිය වෙත තැන්පත් කර තිබුණු රු.75,000 ක මුදල, ආපසු ලබාගෙන නොතිබුණි. | අදාළ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | සභා තීරණයක් අනුව කටයුතු කරමි. |
| (ආ) 1995 සිට 2013 දක්වා අවස්ථා 177 කදී විවිධ කාර්යයන් සඳහා ගෙවා තිබූ රු.1,615,162 ක අත්තිකාරම් පියවාගෙන නොතිබුණි. | අත්තිකාරම් මුදල් පියවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට අත්තිකාරම් මුදලින් 137,490ක් අයකර ඇත. |

3.3 සේවක පුරප්පාඩු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලයට අනුව 2018 දෙසැම්බර් 31 දින වන විට තනතුරු 17 ක පුරප්පාඩු 55 පැවති අතර තනතුරු 04 ක අතිරික්ත සේවකයින් 08 ක් විය. | කඩිනමින් සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්තය විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | අදාළ ආයතන දැනුවත් කර ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 නොවැම්බර් 30 දින ජල සැපයුම් ව්‍යාපෘතියක් සඳහා රු.196,932 ක් අත්තිකාරම් ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතියේ වැඩ කිසිවක් ආරම්භකර නොතිබුණු අතර, ගෙවා තිබූ අත්තිකාරම් මුදල පියවාගෙනද නොතිබුණි. | අත්තිකාරම් මුදල් අයකරගත යුතුවේ. | අත්තිකාරම් පියවන ලෙසට සිහිකැඳවීම් යවා ඇත. |

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ වටිනාකම රු.2,442,500 ක්වූ සංවර්ධන ව්‍යාපෘති 41 ක් ක්‍රියාත්මක කර නොතිබියදී ඒවා සිදු කළ බවට අදාළ ලියකියවිලි ඇතුළත්කර එක් එක් ව්‍යාපෘති ලිපිගොනු සකස් කර කාර්ය සාධන වාර්තාද ඉදිරිපත් කර තිබුණි. | ලැබෙන ප්‍රතිපාදන වර්ෂය තුළ ප්‍රයෝජනයට ගැනීයට කටයුතු කළ යුතුවේ. | මේ වන විට 66% ක ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. |

3.6 ඌන උපයෝජිත වත්කම

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් සභාව වෙත ලබා දී තිබුණු රු.2,500,000 ක් වටිනා මෝටර් ග්‍රේඩරය ප්‍රදේශයේ භූ විෂමතා අනුව භාවිතා කළ නොහැකි බැවින් වසර 04කට අධික කාලයක් නිෂ්කාර්යව පවතී. | ප්‍රයෝජනයට ගතහැකි පළාත් පාලන ආයතනයකට පවරා දිය යුතුවේ. | අදාළ බලධාරීන් දැනුවත්කර ඇ. |
| (ආ) | සභාවට අයත් වාහන 04 ක් සහ යතුරු පැදි 02 ක් වසර 04 කට අධික කාලයක් ධාවනයෙන් ඉවත්කර තිබුණු අතර, ඒවා අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට පළාත් පාලන කොමසාරිස්වරයාට දන්වා ඇත. |